මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ, මුද්දර ගාස්තු, ප්‍රාග්ධන ආධාර ආදායම් හා විගණන ගාස්තු වියදම් උපචිත පදනම අනුව ගිණුම් තබා නොතිබුණි. | උපචිත පදනම අනුව ගිණුම් තැබිය යුතුවේ. | පිළිගනිමි. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස 02 ට අදාල උසාවි දඩ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගන්නා අතර තොරතුරු නොලැබීම හේතුවෙන් ආදායම හඳුනාගැනීමට නොහැකිවූ බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන නොතිබුණි. | ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගන්නා අතර තොරතුරු නොලැබීම හේතුවෙන් ආදායම හඳුනාගැනීමට නොහැකිවූ බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාව වෙත ලැබී තිබූ ප්‍රාග්ධන ආධාර රු. 28,036,524 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම්, නිරූපනය කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සභාව විසින් මෙතෙක් ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති 03 ක වටිනාකම රු. 520,000 ක් ණයගිමියන් වශයෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන තෙක් නැත්පතු යටතේ ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**----------------------------------------------------**

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම<br>------------- |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු. 218,291,314 ක් වූ වත්කම් හා වගකීම් අයිතම 04 ක් විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගෙන ඇත. ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය පවරාගැනීමට ඉල්ලීම් කර ඇති බවත් සමීක්ෂණයක් කර ලේඛනගත කරන බවත්, යන්ත්‍ර හා උපකරණ වටිනාකම හඳුනාගෙන ලේඛන සකස් කිරීමට කටයුතු කරන බවත් සඳහන් කර ඇත. |

**1.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------**

නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති ,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත | | | | |
| (i) | 14(1) වගන්තිය | - | ටෙන්ඩර් කැඳවීමකින් තොරව පුද්ගල ඉල්ලීම් මත හා සභා තීරණයකින් තොරව කඩ කාමර 05 ක් බදු දී තිබුණි. | විධිමත් ආකාරයෙන් බදුදීම් කටයුතු කළ යුතුවේ. | සියළුම කඩ කාමර සඳහා විධිමත් ටෙන්ඩර් කැඳවීම් එකවර සිදුකිරීමේ අරමුණින් මෙම කඩ කාමර අතරමැදි කාලයක් සඳහා පමණක් බදු දීමට ආදායම් රැස්වීමේදී තීරණය කර ඇත. |
| (ii) | 147 හා 149 වගන්ති | - | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බොහෝ ව්‍යාපාරික ස්ථානවලින් බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | සියළුම ව්‍යාපාරික ස්ථාන වලින් අදාල ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නිර්දේශය ලැබී නොමැති හිඟ බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළ නොහැකි බව දන්වමි. |
| (iii) | 158 වගන්තිය | 3,165,828 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු නොගෙවීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් වරෙන්තු නිවේදන නිකුත් කර නොතිබුණු අතර, ප්‍රමාද වී ගෙවනු ලබන වරිපනම් සඳහා දඩ මුදල් අයකිරීම ද සිදුකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා )මූල්‍ය හා පරිපාලන ( රීති සංග්‍රහය<br>------------<br>රීති අංක 203, 214 හා 218 | සභාවේ දේපල සම්බන්ධ පූර්ණ සමීක්ෂණයක් සිදුකල යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දේපල සම්බන්ධ පූර්ණ සමීකෂණයක් පැවැත්විය යුතුවේ. | මේ වන විට සමීක්ෂණය කරමින් පවතී. |

**1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

--------------------------------

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම<br>------------- |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට 1994-2019 කාලයට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 821,061 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකරගත හැකි මුදල් වාරික වශයෙන් අයකර ගන්නා අතර නොහැකි මුදල් කපාහැරීම සඳහා අනුමැතියට යවා ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කර්මාන්ත ණයගැති ශේෂ 16 කට අදාලව එකතුව රු. 1,238,453 ක් වර්ෂ 1 – 2 අතර කාලයක සිට අයවී නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිරවුල් කිරීම සඳහා කටයුතු කරමි. |

**2 මූල්‍ය සමාලෝචනය**

-------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,155,714 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,733,289 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

-------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම් , රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ .31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ .31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 3,771,160 | 4,367,709 | 2,994,216 | 3,912,668 | 2,946,160 | 3,428,682 | 3,197,660 | 3,343,694 |
| (ii) | කුලී | 13,414,340 | 10,020,521 | 7,965,219 | 262,055 | 5,679,440 | 9,318,247 | 9,318,247 | 261,691 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 458,000 | 349,444 | 282,461 | 60,250 | 495,000 | 244,709 | 244,709 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,176,850 | 13,758,053 | 7,202,845 | 12,180,785 | 12,161,650 | 11,815,145 | 2,988,847 | 11,499,465 |
| | එකතුව | 30,820,350 | 28,495,727 | 18,444,741 | 16,415,758 | 21,282,250 | 24,806,783 | 15,749,463 | 15,104,850 |

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ අවසානය වන විට තවදුරටත් උසාවි දඩ ආදායම් රු.5,546,632 ක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් අයවිය යුතුව තිබුණි. | ආදායම් හඳුනාගැනීමට හා අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ උසාවි දඩ මුදල් ලිඛිතව ඉල්ලා ඇති බව සඳහන් කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම 2020 මැයි වන විටත් හඳුනාගෙන නොතිබූ අතර, ඉකුත් වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අදාල මුද්දර ගාස්තු රු. 5,166,941 ක් පළාත් සභාවෙන් අයවිය යුතුව තිබුණි. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ,ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ දිවුලන්කඩවල සතිපොළ රු. 2,247,853 ක | උපයෝජනය කර ගැනීමට කටයුතු කළ | උනන්දුවක් දක්වන පාර්ශව ඉදිරිපත් නොවීම නිසා බදු දිය |

| | | | |
|---|---|---|---|
| | වියදමක් දරා ඉදිකර ඇති නමුත් වර්ෂ 05 ක කාලසීමාවක සිට මෙම සතිපොළ නිෂ්කාර්යව පැවතුණි. | යුතුවේ. | නොහැකි විය. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර 2017 ඔක්තෝබර් 21 දින සිට වැඩ බැලීම සඳහා නිලධාරිනියක් පත්කර තිබුණි. | ස්ථිර නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | සංවර්ධන නිලධාරී තනතුරු 04 ක්, තාක්ෂණික නිලධාරී තනතුරක්, පුස්තකාලාධිපති තනතුරක් පුරප්පාඩුව පැවති අතර, කළමනාකරණ සහකාර තනතුරු 02 ක් අතිරික්තව පැවතුණි. | අවශ්‍යතාවය පරිදි කාර්යමණ්ඩල සංශෝධනය කරගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු 06 ක් හා අතිරික්ත 02 ක් ඇත. |
| (ඇ) | මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.32,679 ක සේවක ණය අයකරගෙන නොතිබුණි. | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුවේ. | ඇප විස්තර නොමැති බැවින් අයකරගත නොහැක. |

**3.4** **වත්කම් කළමනාකරණය**

(අ) නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | සභාවට අයත් වත්කම් අයිතම 07 ක් වර්ෂ 1-17 දක්වා කාලයක සිට නිශ්කාර්යව හා ස්වභාවික ආපදාවන්ට ලක්වෙමින් පැවතුණි. | වත්කම් උපයෝජනය හෝ අපහරණය සඳහා කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. 56-5060 කැබ් රථය නිරවුල් කරගැනීම සඳහා උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත දැනුවත් කර ඇත. |
| (ආ) | සභාව විසින් භාවිතා කරනු ලබන රථවාහනයක අයිතිය පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් විමසූවිට භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැති බව සඳහන් කර ඇත. |

## 4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

### 4.1 අභ්‍යන්තර විගණනය
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇතත් එම නිලධාරිනියට වෙනත් රාජකාරිද පවරා තිබීම හේතුවෙන් අපේක්ෂිත අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක වී නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සඳහා වෙනමම නිලධාරියෙකු පත්කළ යුතුවේ. | පිළිගනිමි. කාර්යය මණ්ඩල පුරප්පාඩු හේතුවෙන් සිදුකල නොහැකි විය. |